# දඬුවම හා මරණ දඬුවම පිළිබඳ සෙසරේ බැකැරියානු විශ්ලේෂණය ඇසුරින් කෙරෙන ආචාර විද්‍යාත්මක අධ්‍යයනයක්

## An Ethical Study of Punishment and Capital Punishment with special reference to Cesare Beccaria's Analysis

ගෝනලගොඩ නන්ද හිමි

**Abstract**

Punishment and Capital Punishment are very famous topics in contemporary society and people are discussing them as a new tendency. No one can exactly state that where and how the Punishment was originated and giving an accurate definition also is very difficult. Is it possible to impose Capital Punishment on a human by another human? It is a distinct and disputable topic is racied by the mony scholars in today. Not only the past but also the present many instances are provided in related to this context, especially, Capital Punishment which can consider as the final result of all punishment. As Beccaria's Analysis states, the government hasn't the power to promulgate Capital Punishment though it has the power to Punish and control beings. Thus, Capital Punishment is not an eassential punishment proces. This research mainly focuses on Cesare Beccaria's Analysis of Punishment and Capital Punishment. Besides, the attention of this study is to pay the Moral and Ethical Theories in Western Philosophy. The collected data through the library reading will be analyzed and compared the Beccaria's ideas with the other Ethical Theory of Punishment and Capital Punishment.

**Keywords:** Capital punishment, Ethics, Philoshpy, Punishment

**සාරසංක්ෂේපය**

වර්තමානයෙහි සාකච්ඡා වන ඉතා ප්‍රසිද්ධ තේමාවක් වශයෙන් දඬුවම සහ මරණ දඬුවම හඳුනාගත හැකිය. මෙහි ආරම්භය කෙසේ කවර අයුරින් හටගත්ත ද යන්න පැහැදිලිව දැක්විය නොහැකි සේම දඬුවම යන්න පැහැදිලිව නිර්වචනය කිරීම ද අපහසු වේ. දඬුවම් කිරීමෙහි අවසන් අදියර වනුයේ මරණ දඬුවමයි. එහෙත් මිනිසකුට තවත් මිනිසකු මරණයට ලක් කළ හැකිද? මෙය සදාචාරාත්මක ගැටලුවකි. මේ සම්බන්ධයෙන් බොහෝ විද්වතුන් විවිධ සාකච්ඡා සිදු කරනුයේ මෙහි ඇති විවාදාත්මක හා මතභේදාත්මක බව හේතුවෙනි. අතීතයෙහි සක්‍රීයව පැවති මරණ දඬුවම නැවත ඇතිකළ යුතු බවට මතයක් ඇතිව තිබේ. මේ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කර ඇති සෙසරේ බැකැරියා සඳහන් කරනුයේ දඬුවම් කිරීමට අවශ්‍ය බලය රජය සතු වුවද මරණ දණ්ඩනය සිදු කිරීමට බලයක් රජය සතු නොවන බවයි. තවද දඬුවම විෂයෙහි මරණ දඬුවම අවශ්‍යම සාධකයක් නොවන බවයි. මෙහිදී බැකැරියානු විශ්ලේෂණය සුවිශේෂී වේ. බැකැරියා දඬුවම් අවම කිරීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කර ඇත. එබැවින් සෙසරේ බැකැරියානු විශ්ලේෂණය ප්‍රධාන කරමින් බටහිර සදාචාර දර්ශනයෙහි සඳහන් සදාචාර එළඹුම් ඔස්සේ දඬුවම සහ මරණ දඬුවම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහිදී සිදු වේ.

**යතුරු පද:** ආචාර විද්‍යාව, දඬුවම, දර්ශනය, මරණ දඬුවම

**හැඳින්වීම**

වෛද්‍යවරයෙක් රෝගියෙකුට ඖෂධ ලබා දෙනුයේ රෝගියාගේ රෝගීභාවය අනුවය. පිළිකා වැනි දරුණු රෝගියෙකුට වුවද තාවකාලික හෝ සැපයක් වෙනුවෙන් ඖෂධ ලබාදේ. එබැවින් දඬුවම හා මරණ දඬුවම යන සංකල්ප දෙස බැලිය යුත්තේ කුමන ආකාරයෙන් ද? නිවාරණය කිරීමේ අදහසින් ද? නොඑසේනම් ඝාතනය කිරීමේ අදහසින් ද? මෙහිදී 'සෙසරේ බැකැරියානු' දඬුවම හා සම්බන්ධ කරුණු ආශ්‍රය කරමින් දඬුවම හා මරණ දඬුවම පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමට නියමිතය. දඬුවම සම්බන්ධයෙන් මෙන්ම මරණ දඬුවම සම්බන්ධයෙන් ද ඉදිරිපත්ව ඇති ධනාත්මක හා ඍණාත්මක සංකල්ප විභාග කරමින් අධ්‍යයනයෙහි නිරත වීමට

අපේක්ෂා කෙරේ. දඬුවම සහ මරණ දඬුවම පිළිබඳ බැකැරියානු විශ්ලේෂණය වාස්තවික කළ හැකිද? යන ගැටලුව මුල් කරමින් දඬුවම හා මරණ දඬුවම සම්බන්ධයෙන් ආචාර විද්‍යාත්මක විමසුමක් සිදු කිරීම මෙහි අරමුණයි. මෙම අධ්‍යනයෙහි වැදගත්කම වනුයේ දඬුවම හා මරණ දඬුවම සම්බන්ධයෙන් ඇති වැරදි අර්ථකථනයන්ගෙන් විතැන්ව ස්වාධීන හා අර්ථාන්විත අර්ථකථනයකට අවශ්‍ය දැනුම වැඩි දියුණු කිරීමයි.

**සාහිත්‍ය විමර්ශනය**

මෙම අධ්‍යයනයේදී සෙසරේ බැකැරියා රචිත On Crimes and Punishments කෘතිය ප්‍රධාන වශයෙන් භාවිත කරණ ලදී. බැකැරියානු දඬුවම පිළිබඳ විග්‍රහය අන්තර්ගත වනුයේ මෙම කෘතියෙහිය. මරණ දඬුවම ප්‍රතික්ෂේප කර ඒ සඳහා විකල්ප වශයෙන් සිදුකළ යුතු ක්‍රියාවන් සම්බන්ධයෙන් ද යොජනා බැකැරියා සිදුකර තිබේ. කුලසේන විදානගමගේ විසින් රචනා කර ඇති දාර්ශනික ගැටලු කෘතියෙහි දඬුවම සම්බන්ධයෙන් දක්නට ඇති සදාචාරාත්මක න්‍යායන් මෙම අධ්‍යයනයේදී විචාරයට ලක්කර තිබේ. මූලික වශයෙන් මෙම අධ්‍යයනයේ දී උපයුක්ත කරනුයේ ඉහත කෘති ද්විත්වයයි. අතිරේකව ආශ්‍රිත ග්‍රන්ථවල ඇති කෘති, පුවත්පත් ලිපි හා අන්තර්ජාල ලිපි උපයුක්ත කර මෙම අධ්‍යයනය සිදුකර තිබේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සංධාර පර්යේෂණ ක්‍රමවේදය මෙම අධ්‍යයනය සඳහා භාවිත කර ඇත.

**සාකච්ඡාව**

වර්තමානයෙහි ඉතා බහුලව සාකච්ඡාවට ලක් වී ඇති ප්‍රස්තුතයක් ලෙස දඬුවම යන සංකල්පය හඳුනාගත හැකිය. මෙම සංකල්පය කවදා කොතැනක සිට ආරම්භ වූයේ ද යන්න නිශ්චිතව දැක්විය නොහැකි වුවද වර්තමාන භාවිතය සම්බන්ධයෙන් අර්ථකථන සිදුකළ හැකිය. ඉංග්‍රීසියෙන් Punishment ලෙස හැඳින්වෙන දඬුවම සම්බන්ධයෙන් අපරාධ විද්‍යාවෙහි Phenology යනුවෙන් 'වරදක් කළ

අයට දඬුවම් දීම, දණ්ඩනය නැත්නම් දණ්ඩන වේදය' ලෙස සාකච්ඡා කෙරේ (රත්නපාල, 2013, 41). දඬුවම සම්බන්ධයෙන් අධ්‍යයනය කරන කල්හි අපරාධය හෝ වරද යන තේමාවන් අත්හැරිය නොහැක. ඊට හේතුව වනුයේ දඬුවම එම ක්‍රියාවන්හි අවසන් ප්‍රතිඵලය වීමය. යමෙක් යම් අපරාධයක් හෝ වරදක් සිදු කළහොත් එයට පිළියමක් ලෙස දඬුවම් ලබාදීම සිදුකරනු ලැබේ. මහාචාර්ය කුලසේන විදානගමගේට අනුව හැමවිටම සමාජයේ යහ පැවැත්මට එල්ල වන බාධක ඉවත්කර ගැනීමේ අපේක්ෂාව දඬුවම තුළ අන්තර්ගත වේ (විදානගමගේ, 2017, 247). මහාචාර්ය නයිජල් වෝකර්ට අනුව රජය මගින් දඬුවම් කිරීමේ අරමුණ වනුයේ හුදෙක් අපරාධ අඩු කිරීම විනා මිනිසුන් තුළ නීතියට ගරු කිරීමේ පුරුද්ද තව තවදුරටත් වර්ධනය කිරීම නොවේය (කොස්තා, 2000, 53). වෝකර්ගේ නිර්වචනයට අනුව රජය මගින් දඬුවම් කිරීමේ අරමුණ වනුයේ හුදෙක් අපරාධ අඩු කිරීම මිස මිනිසුන් තුළ නීතියට ගරු කිරීමේ පුරුද්ද තවදුරටත් වර්ධනය කිරීම නොවේ. සැබවින්ම යම් හෙයකින් අපරාධ අඩුවී අපරාධ නොමැති තත්ත්වයක් ඇති වුවහොත් නීතිය අවශ්‍ය නොවේ. එබැවින් නීතියට ඇති ගරුත්වය වැඩි කිරීමට වඩා එමගින් අපරාධ අවම කිරීම අපේක්ෂා කළ යුතුය. මීට අමතරව මහාචාර්ය නන්දසේන රත්නපාලයන් දඬුවම ලෙස විග්‍රහ කරනුයේ කෙනෙකු වරදක් කළ විට හෝ වරදක් කළේ යැයි සලකනු ලැබූ විට ඔහු අගය කරන, ඔහුට වටිනා දේවලින් ඔහු ඈත් කොට තැබීම, ඒවා ඔහුට ලබා නොදීමට තැත් කිරීම දඬුවම වන බවයි (රත්නපාල, 2013, 41). තවද දඬුවමක් තුළ ලක්ෂණ පහක් තිබිය යුතු බව පැකර් නම් චින්තකයා 'The limits of criminal sanction' හි සඳහන් කොට ඇත.

I. දඬුවම වරද කළ හෝ කළා යැයි සිතන අයකු කෙරෙහිම පැවතිය යුතුය.

II. නීතිමය වරදක් කිරීම සඳහාම පැනවිය යුතුය.

III. එසේ පැනවීම කළ යුත්තේ වරදක් සඳහාම සකස් වූ ඒ සඳහාම බලය පැවරුණු නීතිමය ආයතනයක්/සංස්ථාවක් මගිනි.

IV. වරද කළ තැනැත්තාට පරිබාහිර අය විසින් ඒ දඬුවම ක්‍රියාත්මක කිරීම පරිපාලනය කළ යුතුය.

V. වරදට දඬුවම වන වේදනා හෝ අමිහිරි යැයි සිතන වෙනත් ප්‍රතිඵල ඒ වරද කළ තැනැත්තා කෙරෙහි ඇති කිරීම කළ යුතුය (රත්නපාල, 2013, 45).

පැකර්ගේ විග්‍රහයට අනුව දඬුවම සම්බන්ධයෙන් ඉහත පස් ආකාර වූ ලක්ෂණයන් පරිපූර්ණ විය යුතුය. මෙහිදී දඬුවම් දිය යුත්තේ කාටද? කුමක් සඳහාද? කා විසින් නියම කළ යුතුද? කුමන ආකාරයේ දඬුවමක් විය යුතුද? යන සමහරක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයේ. එහි විශේෂත්වය වනුයේ සිත් පරිදි දඬුවම් ලබාදීමට නොහැකි වීමයි. වර්තමානයෙහි ඇතැම් අවස්ථාවන්හිදී නීතිය මගින් දඬුවම් ලබාදීමට පූර්වයෙන් වෙනත් පාර්ශව මගින් දඬුවම් ලබාදීම සිදුකරන අයුරු දැකිය හැකිය. එබැවින් දඬුවම ලබාදිය යුතු වනුයේ ඒ සඳහාම බලය පැවරුණු නීතිමය සංස්ථාවක් මගින් වීම සුවිශේෂී වන්නකි.

මීට අමතරව මහාචාර්ය නන්දසේන රත්නපාලයන් දඬුවම හා සම්බන්ධ අංශ ත්‍රිත්වයක් දක්වා තිබේ. නිල වශයෙන් පමුණුවන දඬුවම්, නීතියෙන් බාහිර වූ දඬුවම් හා නීති විරෝධී දඬුවම් යනුවෙන් දක්වා ඇත්තේ එම අංශ ත්‍රිත්වයයි (රත්නපාල, 2013, 6). නිල වශයෙන් පමුණුවන දඬුවම් ලෙස හැඳින්වෙනුයේ නීත්‍යානුකූලව සිදුකරනු ලබන දඬුවම් වේ. උසාවියක් මගින් හෝ පොලීසියක් මගින් හෝ වෙනත් පිළිගත් නීති හා සම්බන්ධ ආයතනයක් මගින් කරනු ලබන දඬුවම්ය. නීතියෙන් බාහිර වූ දඬුවම් වනුයේ නීතියේ සඳහන් නොමැති එහෙත් භාවිතය හා පැවැත්ම පිළිබඳ දඬුවම් වේ. නිදසුනක් ලෙස අපරාධයක් කළ අයෙකු සමග ගනුදෙනු කිරීමට ඇති අකැමැත්ත පෙන්වා දිය හැකිය. නීතියට අදාළ නොවන නීතිය බණ්ඩනයට ලක් කරමින් සිදුකරනු ලබන දඬුවම් නීති විරෝධී දඬුවම් වේ.

පැකර්ගේ විග්‍රහයට සමානව යමින් ආචාරධර්මවාදීන් ද දඬුවම යුක්ති යුක්ත වීම පිළිබඳ අදහස් දක්වා ඇත. ආචාරධර්මවාදීන්ට අනුව දඬුවමක් ලබා දීමට කරුණු හතරක් පරිපූර්ණ විය යුතුය.

I. නිශ්චිත වරදක් තිබීම අවශ්‍යය.

II. එකී වරදට වගකිව යුතු අයෙකු සිටීම අවශ්‍යය.

III. දඬුවම් දෙන තැනැත්තෙකු සිටිය යුතුය.

IV. ලබාදෙන දඬුවම වරදට ප්‍රමාණවත් එකක් වීම අවශ්‍යය (උපනන්ද හිමි, 2010, 30).

මේ ආකාරයෙන් හඳුනාගත හැකි දඬුවම සම්බන්ධයෙන් විවිධ චින්තකයන් හා ආචාර විද්‍යාඥයන් විවිධාකාර එළැඹීම් ඔස්සේ විග්‍රහ කොට ඇත. ඒ සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති වාද සතරක් උපයෝගී කරගනිමින් දඬුවම පිළිබඳ තවදුරටත් විස්තර කිරීමට අපේක්ෂා කෙරේ.

1. නිවාරණාත්මක වාදය (Rehabilitative theory)
2. ප්‍රතිඵලාත්මක වාදය (Retributive throry)
3. උපයෝගිතා වාදය (Utilitarianism theory)
4. ප්‍රතිසංස්කරණ වාදය (Reformative theory)

(විදානගමගේ, 2017, 250).

**නිවාරණාත්මක වාදය**

දඬුවම සම්බන්ධයෙන් සාකච්ඡා කරන කල්හි නිවාරණාත්මකවාදය සුවිශේෂී වේ. මෙමගින් සිදුකරනුයේ වරදකරුවන්ට දඬුවම් දී සමාජයට සුසමාදර්ශයක් ලබාදීමයි. ඉන් සමාජය දඬුවම පිළිබඳ දැනුවත් වන අතර අපරාධවලින් වැලකී සිටීමට කටයුතු කළ යුතු බව ඒත්තු ගැන්වීම සිදු කරනු ලැබේ. ඒ අනුව නිවාරණාත්මකවාදයෙහි අරමුණ වනුයේ වරදකරු නිවැරදි කොට පුනරුත්ථාපනය කිරීම නොව සමාජයේ ජීවත්වන පුද්ගලයන් යහපත් කිරීමය. මෙයින් 'සිරකරුවෝ ද මිනිසුන්ය' යන ප්‍රකට කියමන බණ්ඩනයට ලක් වේ. ඊට හේතු වනුයේ මිනිසා හුදු උපකරණයක් වශයෙන් ගෙන සමාජයට යහපත පෙන්වා දීමය. ඉමානුවෙල් කාන්ට් 'සෑම පුද්ගලයෙක්ම උපකරණයක් වශයෙන් නොව නිෂ්ඨාවක් වශයෙන් සැලකිය යුතුය' යනුවෙන් ප්‍රකාශ කොට ඇත (උපනන්ද හිමි, 2010, 34). එයින් ද පුද්ගලයා උපකරණයක් ලෙස භාවිත නොකළ යුතු බව කියවේ. ආචාර වාදීන්ගේ දැඩි විවේචනයට ලක්වූ මෙම වාදය

සමාජයේ යහපත් ප්‍රගමනය උදෙසා වැරදි කළ පුද්ගලයාට දඬුවම් දීම අනුමත කරයි. එහෙත් දඬුවමක් මගින් අපේක්ෂා කළ යුතු වනුයේ වරද නිවැරදි කොට සුචරිතවත් අයෙකු සමාජයට බිහි කිරීමය.

## ප්‍රතිඵලාත්මකවාදය

පැරණි වැඩවසම් යුගයේ භාවිත වූ දඬුවම් ක්‍රමයක් ලෙස මෙය හඳුනා ගත හැකිය. වරදක් සිදු කරන ලද පුද්ගලයා සිදුකරන ලද වරදෙහි ප්‍රමාණය අනුව ඒ හා සමාන දඬුවමක් පැනවීම මෙහි ස්වභාවයයි. බොහෝ දෙනාගේ මතය වනුයේ පළිගැනීමේ චේතනාව මෙහි අන්තර්ගත වන බවයි (එදිරිසිංහ සහ පෙරේරා, 2001, 225). නමුත් දඬුවමක් මගින් පළිගැනීමක් හෝ ඒ හා සමාන දඬුවමක් ලබා දෙන්නේ නම් එය කෙතරම් සාධාරණ ද යන්න ගැටලු සහගතය. නිදසුනක් ලෙස යමෙක් සොරකමක් සිදු කළහොත් ඔහුගේ වස්තුව පවරා ගැනීම මේ අනුව සිදු කරනු ලබයි. එහෙත් එහි ප්‍රතිඵලය වනුයේ තවත් සොරෙක් බිහි කිරීම නොවේද? සියල්ල අහිමි වූ එම පුද්ගලයා නැවතත් එවැන්නක් සිදු කිරීමට පෙළඹේ. එසේම බාලවයස්කාර හෝ තරුණයකු යම් බරපතල වරදක් සිදු කළහොත් ඒ හා සමාන දඬුවමක් ලබා දුන් කල්හි ඔහු/ඇය සුචරිතවත් කළ හැකි ද යන ගැටලු මෙමගින් ඇති වීම නොවැළැක්විය හැකිය.

## උපයෝගිතාවාදය

යම් වරදක් සිදු කළහොත් එයින් සිදුවන අලාභය නැති කිරීම පිණිස දඬුවම් නියම කළ යුතුය යන අදහස උපයෝගිතාවාදීහු ඉදිරිපත් කරති. වරදට දඬුවමක් යන ප්‍රතිඵලාත්මකවාදයට එහා යමින් යම් උපයෝගී පදනමක් මත පිහිටමින් දඬුවම විග්‍රහ කොට ඇති බව හඳුනා ගත හැකිය. එනම් යම් වරදක් සිදු කළහොත් එයින් අලාභයක් නොහොත් පාඩුවක් සිදුවේය යන උපන්‍යාසය මත පිහිටා එයට විකල්පයක් ලෙස දඬුවමක් නියම කිරීම මෙහි ස්වභාවයයි. නමුත් මේ සම්බන්ධව ගැටලු පවතී. නිදසුනක් ලෙස වෛද්‍යවරයකු ගබ්සාවක් සිදු කළහොත් (ගබ්සාව නීති විරෝධී රටක) සිදුකළ අලාභයට ලබාදෙන දඬුවම කුමක්ද? වෛද්‍යවරයාට මරණ දඬුවම ලබා දීම ද? මේ ආකාරයෙන් බලන කල උපයෝගිතාවාදය ද දඬුවම හා සම්බන්ධ ප්‍රායෝගිකකරණය කිරීමට අපහසුය.

**ප්‍රතිසංස්කරණවාදය**

වර්තමානයෙහි බහුලව භාවිතවන ක්‍රමයක් ලෙස ප්‍රතිසංස්කරණවාදය හැඳින්විය හැකිය. මෙහිදී මූලික වශයෙන් ප්‍රේරිත වනුයේ වරදක් කළ පුද්ගලයාට චරිත ශෝධනයට අවස්ථාවක් ලබාදී නැවත සමාජගත කිරීමය. මෙම මතය දරන ඇතැමුන්ගේ අදහස වනුයේ වරදක් කළ පුද්ගලයාට ශාරීරික හෝ මානසික දඬුවමක් නොකළ යුතු බවයි. එසේම අදාළ දඬුවම් කාල සීමාවෙන් පසුව නැවත සමාජයට මුහුණ දීමට හැකිවන පරිදි චරිතය හැඩගැස්වීම සිදුකළ යුතු බව ප්‍රතිසංස්කරණවාදීහු කියති.

පූර්වයෙන් දැක්වූ වාදවලට වඩා ප්‍රායෝගික මෙන්ම ආචාරාත්මක ක්‍රමයක් ලෙස මෙම ක්‍රමය හඳුනාගත හැකිය. එහිදී වරදක් සිදු කිරීමට මුල් වූ කාරණය පිළිබඳව මෙන්ම සිදුකළ වරද පිළිබඳව ද ස්වයං නිර්ණය කොට නැවත එවැන්නක් ඇති නොවීමට අවශ්‍ය වන කාරණාවන් සිදු කිරීම කළ යුතු බව දැක් වේ. මෙහිදී සිරගත කිරීමට වඩා පුනරුත්ථාපනය කොට සුදුසු රැකියාවකට අවශ්‍ය පුහුණුව ලබාදීම සිදු කරනු ලැබේ. යුධ සමයේදී හමුදාවට යටත් වූ LTTE සාමාජිකයන් පුනරුත්ථාපනය කොට සමාජගත කිරීම මෙයට නිදසුනක් ලෙස පෙන්වාදිය හැකිය. එයින් මිනිස් සම්පත සුරක්ෂිත වන අතර රටට ශ්‍රමිකයන් බිහි කිරීමට ද හැකි වෙයි. නමුත් මේ තුළ ද ගැටලු පවතී. එනම් ප්‍රතිසංස්කරණයට ලක් වීමෙන් පසු නැවත එවැනි තත්ත්වයකට පත්වීමට ඇති සමාජගත ඉඩ ප්‍රස්ථාව නතර නොවීමය. එබැවින් දඬුවමක් නොව වරදක් සිදු නොවීමට අවශ්‍ය පරිසරය බිහි කිරීම වඩාත් ප්‍රායෝගික වේ.

**මරණ දඬුවම**

පුරාතනයෙහි ඉතාමත් සුලභව පැවැති වර්තමානයෙහි දුලභව දැකිය හැකි දරුණුම දණ්ඩන ක්‍රමය ලෙස මරණ දඬුවම (Capital punishment/death penalty) පෙන්වා දිය හැකිය. එසේම සමාජයේ බහුලව සාකච්ඡාවට ලක්වූ හා පිළිගත් එක් නිශ්චිත අදහසක් ද නොමැති සංකල්පයකි. යම් පුද්ගලයෙකු බරපතල වරදක් සිදු කළහොත් (මනුෂ්‍ය ඝාතනයක්...) ඔහුට/ඇයට ලබාදිය හැකි ඉහළම දණ්ඩන ක්‍රම වේදය මරණ දඬුවම වේ. අතීතයේදී කටුගසේ යෑම, කොටින්ට

බිලි දීම, කිඹුලන්ට බිලිදීම, දියේ ගිල්වා මැරීම, ගල්වලින් ගසා මැරීම, කස පහර දීම, හිස ගසා දැමීම, උල සිටුවීම (එදිරිසිංහ සහ පෙරේරා, 2001, 223). වැනි ක්‍රම මරණ දඬුවම් සඳහා ක්‍රියාත්මක කොට ඇත. වර්තමානයෙහි ද එල්ලා මැරීම, විෂ ශරීරගත කොට මැරීම, විදුලි ඔටුණු පළඳවා මැරීම හා වෙඩි තබා මැරීම වැනි ක්‍රියාවන් සිදු කරනු ලැබේ. ඉහළ උසාවි මගින් තීරණය කරනු ලබන මෙම මරණ දඬුවම වර්තමානයෙහි මානව හිමිකම් කවුන්සිලය මගින් ප්‍රතික්ෂේප කොට ඇත. එහෙත් ශ්‍රී ලංකාව තුළ ද නැවත මරණ දණ්ඩනය ඇති විය යුතුයැ'යි මතයක් මෑත සිට සමාජගත වෙමින් පවතී. නමුත් මේ පිළිබඳ විවිධ මත පවතින බැව් හඳුනාගත යුතුය.

'මරණ දඬුවම සමාජයේ ම්ලේච්ඡත්වය ප්‍රකට කරන්නකි. එහෙයින් මරණ දඬුවම මගින් ශීලාචාර ශිෂ්ට සම්පන්න සමාජයක් බිහිකර ගැනීමට නොහැකිය' (රාජපක්ෂ. දිනමිණ විශේෂාංග 2015 සැප්තැම්බර් 24). මෙම සටහනට අනුව මරණ දඬුවම මගින් සමාජයේ අශිෂ්ට බව ප්‍රකට වේ. එහෙත් වරදක් කළහොත් ඒ සඳහා මරණ දණ්ඩනය පවා ලැබීමට ඇති ඉඩකඩ ගැන මහජනයා අවධියෙන් පසු වේ. එබැවින් මරණ දඬුවම මගින් පුරවැසියන්ට ආදර්ශයක් ලබාදීමට හැකිවේ (එදිරිසිංහ සහ පෙරේරා, 2001, 224). යන විචාරය ගත්කළ එයින් මරණ දඬුවම අනුමත කොට ඇති බව පෙනේ. මේ සම්බන්ධයෙන් මානව කේන්ද්‍රීයව බලන මානවවාදීන් දක්වන අදහස වනුයේ මරණ දඬුවමට පත් නොකොට ජීවිතාන්තය දක්වා සිරගත කිරීමක් සිදු කිරීම මරණ දඬුවමට වඩා ප්‍රායෝගික හා උපයුක්ත වන බවයි. ඇතැමුන්ගේ අදහස වනුයේ සිරමැදිරියක මැරි මැරී ජීවත් වනවාට වඩා මරණය වැළඳ ගැනීම සුදුසු වන බවයි. මේ අනුව බලන කළ මරණ දඬුවම යන සංකල්පය ඉතා විසුළ සංකල්පයක් බව පැහැදිලිය. මරණ දඬුවමට යමෙක් පත් වූ විට නැවත වරක් එය ලිහිල් කිරීම අපහසුය. යම් හෙයකින් මරණ දඬුවම මගින් මරණයට පත් වූවෙකු පසුකාලීනව නිවැරදි යැයි සනාථ වුවහොත් ඔහුට/ඇයට සිදුවන අපරාධය කෙලෙස සාධාරණය කරන්නේද? යන ගැටලුව මේ සමග ඉදිරියට පැමිණේ. 2008 වසරේදී අපරාධ විද්‍යාඥයන් 76 දෙනකුගේ මතවාදයන් එකතුකොට එළිදක්වන ලද 'Do Executions Lower Homicide Rate' නම් පර්යේෂණ පත්‍රයට අනුව මරණ දඬුවමෙන් අපරාධ වැළැක්වීම අවම කළ නොහැකිය.

'A recent study by Professor Michael Radelet and Traci Lacock of the University of Colorado found that 88% of the nation’s leading criminologists do not believe the death penalty is an effective deterrent to crime' (https://deathpenaltyinfo.org).

බොහෝ දෙනාගේ මතය වනුයේ මරණ දඬුවම ඇති කිරීම තුළින් මිනීමැරුම් ආදී බරපතළ අපරාධ සිදු කිරීම අවම කළ හැකි බවයි. නමුත් එම පර්යේෂණ පත්‍රයට අනුව මරණ දඬුවම මගින් මිනීමැරුම් සිදු කිරීම අඩු වී නොමැත. එහි දී 88% අපරාධ වේදීන්ගේ මතය වනුයේ මරණ දඬුවම අපරාධ නිවාරණයට හේතු නොවන බවයි. (බදාදා දිවයින අතිරේකය, 2018 ඔක්තෝම්බර් 24, 01). මරණ දඬුවම සම්බන්ධයෙන් සැකසූ නීති පද්ධතියට අනුව (ඇතැම් රටවල) මරණ දඬුවමට ලක්වූ පුද්ගලයාට ඊට පූර්වයෙන් තමා අදහන ආගම සිහි කිරීමට අවස්ථාව ලබාදීම සිදුකරනු ලැබේ. එහිදී පූජ්‍ය හෝ පූජක පක්ෂයේ අයෙකු ගෙන්වා සිත ආධ්‍යාත්මයට නැඹුරු කිරීමට අපේක්ෂිතය. තවද මෙහි විශේෂත්වය වනුයේ මරණ දඬුවමට නියමිත වේලාවට අනුව මරණ දඬුවම සිදු කිරීමට නොහැකි වුවහොත් (පමා වුවහොත්) ඔහුට හෝ ඇයට ජීවිත දානය ලැබෙන බවට මතයක් පවතීමයි. කෙසේ නමුත් මරණ දඬුවම ප්‍රායෝගික කිරීම සම්බන්ධයෙන් වර්තමානයේ විශාල ගැටලු පැන නැගෙමින් පවතී. එයට විකල්පයක් ලෙස දියුණු රටවල් විෂ එන්නත් කොට මරණය ඔහු කරා පැමිණ වීම සිදු කරනු ලැබේ. එසේම මානසික පීඩනයක් ඇති කොට මරණ දණ්ඩනය ඔහු කරා ළඟා කරවීම ද නූතනයෙහි සිදුකරන අයුරු දැකගත හැකිය.

**දඬුවම හා මරණ දඬුවම පිළිබඳ බැකැරියානු විග්‍රහය**

ඉතාලි ජාතික අපරාධ විද්‍යාඥයෙකු ලෙස ප්‍රකට සෙසරේ බැකැරියා (Cesare Beccaria) 1738-1794 අතර කාලයෙහි ජීවත් වී තිබේ. අපරාධය පිළිබඳව ප්‍රතික්‍රියා දක්වන ආකාරය විවේචනයට ලක් කළ මොහු On crime and punishment නම් වෙළුමෙහි සිය විචාරය ඉදිරිපත් කොට ඇත. අපරාධ විද්‍යාව සම්බන්ධයෙන් ගත්කල පරිපූර්ණ ග්‍රන්ථයක් රචනා කළ පළමු පුද්ගලයා මොහු වන අතර මරණ දඬුවම සම්බන්ධයෙන් ද පළමු නූතන විවේචකයා වනුයේ

බැකැරියෝ ය. මීට අමතරව නූතන අපරාධ නීතියෙහි හා අපරාධ යුක්ති විනිශ්චයෙහි පියා වනුයේ ද මොහුය. (Hostettler, 2011, 160). අපරාධ හා මරණ දඬුවම පිළිබඳ නව මානයක් ඔස්සේ මතවාදයක් ඇති කිරීමට ප්‍රධාන වශයෙන් බැකැරියෝට බලපාන ලද්දේ ෘැකඩැඑසම් නම් චින්තකයාය. ඊට අමතරව පීතෘ (Pietro) හා ඇලෙක්සැන්ඩර් වෙරි (Alessandro verri) නම් සමීපතමයන්ගේ ඇසුර ද ඔහුගේ චින්තනය සකස් වීම කෙරෙහි බලපා ඇති බව පෙනේ. මීට අමතරව ඔහුගේ චින්තනය ජෙරමි බෙන්තම්ගේ (Jerami bentam) අපරාධ හා සම්බන්ධ සංකල්පයන්ට සමාන බව නන්දසේන රත්නපාලයන් දක්වයි (රත්නපාල, 2013, 50). බැකැරියානු විග්‍රහයට අනුව ප්‍රධාන වශයෙන් දඬුවම් වර්ග තුනක් දැකිය හැකිය.

1. සමාජයට ඉතාමත් හානිදායක අපරාධ, රාජ්‍යකට හෝ රටකට ද්‍රෝහිවීම

2. සමාජය හෝ පුද්ගලයන්ගේ දේපළවලට හානි කරන අපරාධ

3. පොදු සාමය හා සාමය කඩ කරන, එයට හානි කරන, කැරලි ගැසීම්, මිනිසුන් ප්‍රකෝප කිරීම් ආදිය. (රත්නපාල, 2013, 50)

මෙම දණ්ඩන වර්ග කිරීමෙහි විශේෂත්වය වනුයේ එකකට එකක් සාපේක්ෂ නොවීමය. එනම් පළමුවෙන් ඇති වර්ගයට වඩා දෙවැනි වර්ගය ලිහිල් වේ. එයට සාපේක්ෂව තෙවැනි වර්ගය ලිහිල් වේ. එනයින් සලකන කල දඬුවම ද එකකට එකක් සාපේක්ෂ නොවිය යුතුය. දඬුවම් ලබා දීමේදී දඬුවම් ලබා දිය යුතු වනුයේ සිදු කරන ලද අපරාධයෙහි ස්වභාවය හෙවත් ප්‍රමාණය අනුව වේ. බැකැරියානු දඬුවම් විග්‍රහයේ ඇති සුවිශේෂීත්වය වනුයේ පළිගැනීමක් හෝ සිදු වූ හානිය අඩු කිරීමක් ඒ තුළ අන්තර්ගත නොවීමය. නමුත් දඬුවම පිළිබඳ බොහෝ විග්‍රහයන් දෙස බලන කළ ප්‍රකට වනුයේ එමගින් පළිග ැනීමක් අපේක්ෂා කරන බවයි. නමුත් දඬුවම් කළ යුතු වනුයේ යහපත් සමාජයක් නිර්මාණය කිරීමට මිස පළිගැනීමට නොවේ. එසේම මතුවට එවැන්නක් ඇති නොවන පරිදි නිවාරණය කිරීම හා අන් අය අපරාධ කිරීමෙන් වැළක් වීමද බැකැරියානු විග්‍රහයේ අරමුණක් වේ.

'the purpose of punishment is to create a better society, not revenge. Punishment serves to deter others from committing crimes and to prevent the criminal from repeating his crime' (https://en.wikipedia.org/wiki/Cesare Beccaria, On Crimes and Punishments)

බැකෑරියානු විග්‍රහයට අනුව දඬුවම ලබා දිය යුත්තකි. එහෙත් එම දඬුවම ලබා දිය යුතු වනුයේ සිදු කරන ලද අපරාධයට අනුවය. එහිදී වරදකරුගෙන් පළිනොගැනීමට විනිසුරුවරයා වගබලා ගත යුතුය. මීට අමතරව අපරාධ අවම කිරීම සම්බන්ධයෙන් ද බැකෑරියා අවධානය යොමු කොට ඇත. මොහුට අනුව අපරාධ අවම කිරීම සඳහා සුදුසුම ක්‍රමය වන්නේ සරල හා පැහැදිලි නීති පද්ධතියක් පැවතීමයි. තවද යහපත් ගුණ ධර්මයන්ට (ත්‍යාග) ප්‍රතිලාභ ලබා දීම හා අධ්‍යාපනය දියුණු කිරීම ආදී කටයුතු කළ යුතු බව සඳහන් වේ. 'The best ways to prevent crimes are to enact clear and simple laws, reward virtue, and improve education' (IbId) මෙහි විශේෂත්වය ලෙස හඳුනාගත හැකි වනුයේ අපරාධ අවම කිරීම සඳහා යෝජනා වශයෙන් ප්‍රායෝගිකකරණය කළ හැකි යෝජනා ඉදිරිපත් කිරීමය. සරල හා පැහැදිලි නීති පද්ධතියක් පැවතීම මගින් මහජනතාවට නීති පද්ධතිය පිළිබඳ අවබෝධ කරගත හැකිය. බොහෝ අවස්ථාවන්හි නීතියෙහි ඇති සංදිග්ධතා හේතුවෙන් අපරාධ කිරීමට පෙළඹේ. ඇතැම් විට තමා සිදු කරන ලද්දේ අපරාධයක් ද යන්න පවා අපරාධකරු නොදනුයේ නීතියෙහි ඇති සංකීර්ණ බව හේතුවෙනි. මීට අමතරව ගුණධර්ම අගය කිරීම නොහොත් ප්‍රතිලාභ ලබාදීම ද සුවිශේෂී වේ. අපරාධ සිදුවනතුරු නොසිට යහපත් ගුණ ධර්ම ඇති පුද්ගලයන්ගේ ගුණ ධර්මයන්ට වචනයකින් හෝ ප්‍රතිලාභයක් ලබා දිය හැකි නම් එය අගය කිරීමක් වේ. එය ඇතැම් අවස්ථාවන්හි අපරාධ කරන පුද්ගලයන්ට යහපත් අභිප්‍රේරණයක් විය හැකිය. අධ්‍යාපනය දියුණු කිරීම ද අපරාධ අවම කිරීම සඳහා සුදුසු විකල්පයකි. අධ්‍යාපනය දියුණු කිරීම මගින් විද්‍යාව පමණක් නොව ගුණ ධර්මයන් ද දියුණු කළ යුතුය. නිසි අධ්‍යාපනයක් සහිත පුද්ගලයාට වඩා අධ්‍යාපනයක් නොමැති පුද්ගලයා අපරාධවලට යොමුවන ප්‍රතිශතය වැඩිය. එබැවින් අධ්‍යාපනය වර්ධනය කිරීම මගින් අපරාධ අවම කළ හැකිය. අපරාධ අවම වීම යනුවෙන් සඳහන් වනුයේ දඬුවම් අවම වීමය. මරණ දඬුවම

සම්බන්ධයෙන් බැකැරියානු අදහස වනුයේ එය නොකළ යුත්තක් බවයි. මොහු මරණ දඬුවම කරුණු දෙකක් මත පදනම් වෙමින් ප්‍රතික්ෂේප කොට ඇත.

'First, because the state does not possess the right to take lives; and secondly, because capital punishment is neither a useful nor a necessary form of punishment' (IbId)

මොහුගේ විග්‍රහයට අනුව පළමු කාරණය වනුයේ රජයට ජීවිතය පිළිබඳ තීරණය කිරීමේ හෙවත් ජීවිත බිලී ගැනීමේ අයිතියක් නොමැති වීමයි. රජයක් යනුවෙන් හැඳින්වෙනුයේ යම් පාලනයක් ගෙනයන පිළිගත් ආයතනයක්ය. එහෙත් පාලනයක් ගෙනගිය පමණින් මානව ජීවිත බිලි ගැනීමට හෙවත් මරණයට ලක් කිරීමට නොහැකි බව බැකැරියානු අදහසයි. එහෙත් බැකැරියෝ රජයට දඬුවම් පැමිණවීමට හැකියාවක් ඇති බව පිළිගෙන තිබේ. නමුත් එය සමාජයේ ආරක්ෂාව අතික්‍රමණය දක්වා නොයා යුතු බව මොහු අවධාරණය කරනු ලැබේ.

'So while the government could punish it could not go over than what was necessary for the security of the society' (https://wwwconstitution. org/cb/beccaria_bio.htm)

දෙවන කාරණය වනුයේ මරණ දඬුවම, දඬුවමට අවශ්‍ය කාරණයක් නොවීම හා ප්‍රයෝජනවත්ම කාරණයක් නොවීමයි. එම කාරණයට අනුව දඬුවම පැවතිය යුතුය. එහෙත් මරණ දඬුවම ඒ තුළ අන්තර්ගත වීම අවශ්‍ය නොවේ. එය ප්‍රයෝජනවත් ද නොවේ. මෙම විග්‍රහයට අනුව මරණයට ලක් කිරීමට රජයට අයිතියක් නොවන අතර එවැනි දඬුවමක් පැවතීම ද නුසුදුසුය.

බැකැරියා මරණ දඬුවමට විරුද්ධ වීමට ප්‍රධාන හේතුවක් වනුයේ එය කටුක අත්දැකීමක් වන බැවිනි. එහිදී වෙහෙස මහන්සි වී නිදහස අහිමි කොට මරණයට පත්වීම ඉක්මන් මරණයට වඩා කටුක බව මොහුගේ මතය වේ. මේ ආකාරයෙන් දඬුවම සම්බන්ධ නව මතයක් ඉදිරිපත් කිරීමට එවකට සමාජයේ පැවති සාමාජීය පසුබිම ඉවහල් වන්නට විය. නමුත් මොහු ඉදිරිපත් කරන ලද නව මානය මානවවාදී

මානයක් වේ. මොහුගේ විග්‍රහයේ දී දඬුවම ප්‍රතික්ෂේප නොකොට මරණ දඬුවම පමණක් ප්‍රතික්ෂේප කොට ඇත. එහෙත් දඬුවම් ලබා දීමේදී සිදු කරන ලද අපරාධයට සරිලන දඬුවමක් ලබා දිය යුතු බව දක්වා ඇත. එම දෙන ලද දඬුවමෙහි ප්‍රමාණය නිර්ණය කරනුයේ එය සමාජයට සිදු කරන ලද අලාභයේ තරමටය. බැකැරියානු විග්‍රහය තුළ අපරාධ අවම කිරීම සඳහා නිර්ණායක නවයක් අන්තර්ගතය. එම නිර්ණයන් අතරත දැකිය හැකි සුවිශේෂීත්වය වනුයේ පන්තිය අනුව නොව මිනිසාට ගැලපෙන ආකාරයේ නීති පද්ධතියක අවශ්‍යතාව මතු කිරීමය.

## සංකල්ප තුලනය

දඬුවම හා මරණ දඬුවම යන සංකල්පය දෙස විවිධාකාර දෘෂ්ටි ඔස්සේ සාකච්ඡා කළ හැකි බව පූර්ව කරුණු අධ්‍යයනයේදී පැහැදිලි විය. දඬුවම කායිකව හා මානසිකව සිදුකළ හැකිය. ප්‍රතිඵලාත්මකවාදයෙහි සාකච්ඡා වන පරිදි අතීතයේ 'ඇසට ඇසක්' වැනි නීති කායික දඬුවම් වේ. එසේම අපරාධයක් සිදු කළ පුද්ගලයෙකු හට ලබාදිය හැකි අවසාන කායික දඬුවම වනුයේ මරණ දඬුවමයි. එසේම මානසික පීඩනය ද දණ්ඩන ක්‍රමවේදයක් වේ. ඇතැම් පුද්ගලයන්ට කායික දඬුවමට වඩා මානසික දඬුවම ප්‍රබල අත්දැකීමක් වේ. නිදසුනක් ලෙස ජීවිතාන්තය දක්වා සිරගත කළ පුද්ගලයෙකුගේ සිතුවිලි ගතහොත් එම සිතුවිලි සතුටින් පිරී පවතින සිතුවිලි නොවේ. එම සිතුවිලි පශ්චාත්තාපයෙන් යුත් ඍණාත්මක සිතුවිලිවලින් පිරී පවතී. බ්‍රහ්ම දණ්ඩනය යනුවෙන් සඳහන් දණ්ඩන ක්‍රමවේදයේ දී කායික දඬුවමක් සිදු නොවේ. අනෙක් පුද්ගලයන් කතා නොකිරීම හේතුවෙන් වධයට හා හිංසනයට පත්වනුයේ මනසයි. එබැවින් කායික මෙන්ම මානසික වශයෙන් දඬුවම් ඇත.

දඬුවම යන සංකල්පය වාස්තවික අර්ථයෙන් ගත් කළ කිසියම් අපරාධයක් සිදුකළ විට එයට පෙරලා පැමිණෙන ප්‍රතිවිපාකය නොහොත් ප්‍රතිඵලය ලෙස හඳුනාගත හැකිය. දඬුවම ලබාදිය යුතු වනුයේ සැබෑ අපරාධකරුටය. එසේ නොවන්නේ නම් දඬුවම ද අපරාධයක් වේ. බ්‍රිතාන්‍යයෙහි මෙවැනි අපරාධයක් (නිර්දෝෂී පුද්ගලයෙකු පෝරකයට නියම කොට මරණයට ලක් කිරීම) සිදුවිය.

කාන්තාවක් දූෂණය කර මැරෙන්නට ඉඩ හැර පළා යාමේ සිද්ධියක් මුල් කොට ගනිමින් 1962 අප්‍රේල් 4 වන දින 'බෙඩ් ෆොඩ්' නම් තරුණයෙක් එල්ලා මරණ ලදී. එහෙත් පසුකාලීනව එම නඩුවට අදාළ නව සාක්ෂි සොයා ගැනීමක් සිදු විය. එහිදී පොලීසියට ලැබුණු සාක්ෂි 11 හා පොලිස් වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් නොකිරීම පසුකාලීනව සොයා ගත් සාක්ෂි විය (අයුබ්. ලක්බිම, 2001, 11, 28). එහෙත් එම සාක්ෂි ලබා නොදීමේ විපාකය වනුයේ අහිංසකයෙකු පෝරකයට නියම වීමයි. එබැවින් දඬුවම අපරාධකරුටම ලබාදීමට නීති බලධාරීන් කටයුතු කළ යුතුය.

අපරාධ විෂයෙහි නීති ක්‍රියාත්මක කිරීමේදී කුමක් අරමුණු කරගනිමින් නීති ක්‍රියාත්මක කරන්නේ ද යන ගැටලුව පළමුව සමර්ථනය කළ යුතුය. එහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ යුතු වනුයේ ලබාදෙන දඬුවමෙහි ප්‍රතිඵලය සම්බන්ධයෙනි. ලබා දුන් දඬුවම ප්‍රතිඵල රහිත නම් එය නිෂ්ඵලය. එබැවින් දඬුවම පැවතීම සමාජ පැවැත්මට අනිවාර්ය වුවද කුමක් ඉලක්ක කොට පවතී ද යන්න නිරවුල් කිරීම වටී. එසේම දඬුවම් ලබා දෙනුයේ කා විසින්ද යන ගැටලුවක් මේ සම්බන්ධයෙන් ඇති වේ. සදාචාරාත්මකව දඬුවම් නියම කරන පුද්ගලයා අපරාධවලින් වැළකී සිටින්නෙකු නම් ආත්මීය සාධකයන්ගේ බලපෑමකින් තොරව දඬුවම් නියම කළ හැකිය.

අපරාධ විෂයෙහි දඬුවම් ලබාදීමේ අවසාන අවස්ථාව වන මරණ දඬුවම එතෙක් මෙතෙක් ස්ථිර විසඳුමක් නොමැති සංකල්පයක් වේ. එහෙත් වර්තමානයෙහි මරණ දඬුවම දුලභ කරුණක් වුව ද නැවතත් මරණ දඬුවම හිස එසවීමේ සේයාවක් දැකිය හැකිය. මේ සම්බන්ධයෙන් ආගමික නායකයන්ගේ මෙන්ම බොහෝ දෙනාගේ අදහස වනුයේ මරණ දඬුවම අහෝසි කළයුතු බවයි. ඊට ප්‍රධාන හේතුවක් වනුයේ වෙනත් කෙනෙකුගේ ජීවිතය සම්බන්ධයෙන් තීරණය ලබාදීමට තරම් කුරිරු විය හැකි ද යන ගැටලුවයි. මෙහිදී වර්තමානයේ දැකිය හැකි ප්‍රබල තර්කයක් වනුයේ අසීමාන්තිකව පුද්ගල ඝාතන ආදිය කරන්නෙකු සමාජයේ ජීවත්වීම පවා අපරාධයක් බැවින් ඔහුට/ඇයට මරණ දඬුවම් ලබා දී මරණයට ලක් කිරීම සමාජයේ පැවැත්මට හේතු වේ යන මතයයි. නමුත් ඔහු/ඇය මරණයට ලක් කිරීම මගින් සමාජ සුචරිතයක් ඇති වේද? යන ගැටලුව ඉන්

මතුවේ. නිදසුනක් ලෙස අපරාධවේදීන් සිදුකරන ලද (පෙර මරණ දඬුවම විස්තරයෙහි ඇති) පර්යේෂණය පෙන්වා දිය හැකිය. ඔවුන්ගේ නිගමනය වනුයේ මරණ දඬුවම ලබා දුන් පමණින් අපරාධ නිවාරණය සිදු නොවේ යන්නයි. ඒ අනුව මරණ දඬුවම සදාචාරාත්මකව අනුමත කළ නොහැකි බව පැහැදිලි වේ. එබැවින් සුචරිතවත් සමාජයක් බිහි කිරීම කළ යුතුය. එහිදී ප්‍රතිසංස්කරණවාදයෙහි එන ආකාරයට ඕනෑම අපරාධකරුවෙකු ප්‍රතිසංස්කරණයට ලක්කොට චරිත ශෝධනයක් සිදු කිරීමට තරම් නීති ප්‍රතිසංස්කරණයක් වීම අවශ්‍ය බව පෙන්වා දිය හැකිය.

**සමාලෝචනය**

දඬුවම හා මරණ දඬුවම පිළිබඳ බැකැරියානු විග්‍රහයට ප්‍රමුඛත්වයක් ලබා දෙමින් සිදු කරනු ලැබූ මෙම අධ්‍යයනයේ දී ඒ හා සම්බන්ධව පුළුල් වශයෙන් සාකච්ඡාවට ලක් කරන ලදී. මානවයාගේ පැවැත්ම පිණිස මානවයා විසින්ම සකසන ලද ක්‍රමවේදයක් ලෙස දඬුවම පෙන්වා දිය හැකිය. එකී දඬුවමෙහි අවසන් අධියර වනුයේ මරණ දඬුවමයි. මරණ දඬුවම අතීතයෙහි සක්‍රීයව පැවති දණ්ඩන ක්‍රමයකි. එහෙත් වර්තමාන මානව හිමිකම් සංවිධානයන්හි ක්‍රියාකාරකම් හමුවේ මරණ දඬුවම අහෝසි වෙමින් පවතී. මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම මගින් සමාජය සුචරිතවත් හෝ ආරක්ෂාකාරී කිරීමට හැකි යැයි සිතන්නේ නම් එය සක්‍රීයව පැවති අවධියෙහි සිදුවීම් නිදසුනට ගනිමින් පූර්වාපර ගැලපීම සිදුකළ යුතුය. තවත් කෙනෙකුගේ ජීවත්වීමේ අයිතිය තවත් කෙනෙකුට තොර කළ හැකිද? යන ප්‍රශ්නය තමාගෙන් විමසූ විට ලැබෙන පිළිතුර වූයේ නැත යන්නයි. එබැවින් මරණ දඬුවම අහෝසි කළ යුතුය. එහෙත් දඬුවම අපරාධය උදෙසා පැවතිය යුතුය. එවැනි දඬුවම් සම්බන්ධයෙන් කාලීන සාකච්ඡාවක් ඇතිවිය යුතු වේ. එහිදී මනුෂ්‍ය ඝාතනයක් හා සමාන බරපතල අපරාධයක් සිදු කරන පුද්ගලයා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට ලක්කිරීම වඩා ප්‍රායෝගික වේ. එහෙත් එය සිතන තරම් පහසු නොවනු ඇත. එබැවින් පළමුව කළ යුතු වනුයේ වාස්තවික අපරාධ නීති පද්ධතියක් සකස් කොට ක්‍රියාත්මක කිරීමය. අනතුරුව සියලු ළමුන්ට ඉගෙන ගැනීමට අයිතිය තහවුරු කොට අධ්‍යාපනය නගා සිටුවිය යුතුය. එසේම බරපතල අපරාධ සිදු කරන්නන්ගේ චරිත

ශෝධනයට ලක් කරමින් ප්‍රතිසංස්කරණය කොට, නැවත සමාජගත කිරීමට හෝ රඳවා තබමින් සමාජ සේවයක් කිරීමට තරම් චිත්ත පාරිශුද්ධියක් ඇති නිරවුල් පුද්ගලයෙකු බිහි කිරීමට අවශ්‍ය නීතිමය රාමුවක් සැකසීම සිදුකළ යුතුය. තවද රට තුළ ස්වයං රැකියාවක් කොට හෝ ජීවිතය ගෙන යාමට තරම් ආර්ථික වර්ධනයක් ඇති කොට, පුද්ගල ආර්ථිකය ගොඩ නැංවීමට අවශ්‍ය පියවර කඩිනමින් ඇති කිරීම ද සිදුකළ යුතු වේ. ඊට අතිරේකව සදාචාර සංකල්පනා ප්‍රායෝගිකකරණය කළ යුතුය. ඒ අනුව මේ සියලු කරුණු තුළින් පැහැදිලි වනුයේ බැකැරියානු විශ්ලේෂණය වාස්තවික කිරීමෙහිලා ප්‍රායෝගික වන බවයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ද්විතීයක මූලාශ්‍ර

උපනන්ද හිමි, රත්තොට. (2010). දාර්ශනික ප්‍රවේශය. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. එදිරිසිංහ, දයා සහ පෙරේරා, ඥානදාස. (2001). දාර්ශනික විමර්ශන. දෙහිවල: වත්මා ප්‍රකාශකයෝ.

කොස්තා, ජයතිස්ස ද. (2000). අපරාධ විද්‍යාව. කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රත්නපාල, නන්දසේන. (2013). අපරාධ විද්‍යාවේ මූල ධර්ම. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විදානගමගේ, කුලසේන. (2017). දාර්ශනික ගැටලු. නාරම්මල: කතෘ ප්‍රකාශන.

### පුවත්පත්

අයුබ්. එස්. එම්. (2001, 11, 28,). 'මරණ දඬුවම පැනවීමට පෙර පොලීසිය ද ශුද්ධ කළ යුතුය' ලක්බිම.

චන්දන, විශ්ව. (2018, 10. 24). 'ශ්‍රී ලංකාවේ මරණ දඬුවම කෙරෙහි බලපාන නෛතික විධිවිධාන' බදාදා දිවයින අතිරේකය.

රාජපක්ෂ, සමන්. (2015, 09. 24. ). 'මරණ දඬුවම රටට අවශ්‍යද?' දිනමිණ විශේෂාංග.

### English and websites

Hostettler. (2011). John Cesare Beccaria: **The Genius of 'On Crimes and Punishments'**. Hampshire: Waterside Press.

Hemmens, Craig and Stephen G. Tibbetts, **Criminological Theory: A Text Reader**, SAGE.

https://en.wikipedia.org/wiki/Cesare Beccaria, **On Crimes and Punishments Accessed on**

https://deathpenaltyinfo.org/news/study-88-of-**criminologists-do-not-believe-the-death-penalty-is-an-effective-deterrent** Accessed on 30rd 01 2021.